**මැදවච්චිය ප්‍රාදේශීය සභාව - 2021**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මැදවච්චිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය වෙනුවෙන් ඉදිරි වර්ෂය සඳහා ගෙවිය යුතු රු.1,824,131 ක් වූ මූල්‍ය පිරිවැය ජංගම වගකීම් ලෙස දක්වා නොතිබුණු අතර සමස්ථ ශේෂය ජංගම නොවන වගකීම් ලෙස වත්කම් සහ වගකීම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | පිළිගනිමි. | ඉදිරි වර්ෂය සඳහා ගෙවිය යුතු ණය ජංගම වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත යුතුවේ. |

#### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 16 අනුව දේපල පිරියත හා උපකරණ වටිනාකම සහ උපලේඛන අනුව දේපල පිරියත හා උපකරණ වටිනාකම අතර රු.8,128,453 ක වෙනසක් විය. | 2020 වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට සිදුකළ ගැලපීම් වත්කම් සාරාංශ ලේඛනයේ සටහන් නොවීම නිසා මෙම වෙනස ඇති වී ඇත. | වෙනස්කම් උපලේඛනවල නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. |

#### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු.9,015,115 ක්වූ ගිණුම් විෂයයන් 02 ක් සඳහා විස්තරාත්මක උපලේඛන සහ වයස් විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. | නිරවුල් කිරීමට පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත. | ශේෂ තහවුරු කිරීමට පිළිගත හැකි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

#### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1951 අංක 14 දරන මෝටර් වාහන පනතේ 99(1) හා 104(1) වගන්ති | වටිනාකම රු.1,500,000 ක්වූ සභාව සතු ට්‍රැෆේ ට්‍රැක්ටරයක් ලියාපදිංචි නොකර ධාවනය කර තිබුණි. | ලියාපදිංචි කිරීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. | මෝටර් වාහන පනත ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| **(ආ)** | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ අංක 3.1 වගන්තිය | සභාව සතු සක්‍රීය වාහන 04 ක ඉන්ධන දහන පරීක්ෂාවන් චක්‍රලේඛ අනුව කර නොතිබුණි. | ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකළ යුතුවේ. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ අයභාරය රු.3,868,526 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අයභාරය ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.35,673,108 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වරිපනම් බදු රු.3,288,548 ක් ද ඒකක 288 කින් අයවිය යුතු ව්‍යාපාර බදු රු.501,900 ක්ද, ඒකක 52 කින් අයවිය යුතු කර්මාන්ත බදු රු.232,750 ක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පනතේ උපදෙස් ප්‍රකාරව වරිපනම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | **කුලී** | | |
| | සභාව සතු පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 31 කින් පුරනැගුම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 46 කින් හා සමාලෝචිත වර්ෂයේ හා පූර්ව වර්ෂවල ටෙන්ඩර් බදු දුන් දේපල 49 කින් අයවිය යුතු රු.19,690,818 ක කඩකුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | හිඟ ආදායම් අයකර ගැනිම සඳහා ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව ක්‍රියාකළ යුතුවේ. |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| (i) | සභා බල ප්‍රදේශයේ දුරකථන සේවා සම්ප්‍රේෂණ කුළුණු ප්‍රමාණය පිළිබඳ සමීක්ෂණයක් සිදුකර බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සමීක්ෂණයක් සිදුකරමින් පවතී. | සමීක්ෂණයක් සිදුකර බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට ක්‍රියාකළයුතු වේ. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඒකක 88 කින් අයවිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු රු.90,500 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීම සිදුකරමින් පවතී. | හිඟමුදල් අයකර ගැනිමට ක්‍රියාකළයුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නික්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණය අනුව වටිනාකම රු.100,069 ක් වූ පොත් 545 ක් සහ වටිනාකම හඳුනාගත නොහැකි පොත් 81 ක් මැදවච්චිය පුස්තකාලයෙන් අස්ථානගතවී තිබුණු අතර ඒ සඳහා වගකිව යුතු පාර්ශව හඳුනාගෙන එම අලාභය අයකර ගැනීමට හා එසේ පොත් අස්ථානගත වීම වළක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමයක් හඳුන්වාදීමට සභාව කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | අලාභ අයකර ගැනීමට කටයුතු කළයුතු අතර නිසි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළයුතු යුතුවේ. |
| (ආ) | පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ ඉදිකර 2017 ජුලි 20 දින සභාවට පවරාදී තිබුණු කඩ කාමර 46 ක් 2018 වර්ෂයේදී ටෙන්ඩර් කර බදුදී තිබුණු අතර ඒ අනුව 2021 නොවැම්බර් 30 දිනට හිඟ කඩ කුලී හා ප්‍රමාද ගාස්තු ලෙස රු.32,685,100 ක් අයවිය යුතුව තිබුණු නමුත් ගිවිසුම් කොන්දේසි කඩ කළ එම බදුකරුවන් අසාදු ලේඛනගත කිරීමට හා නැවත ටෙන්ඩර් කැඳවීමට සභාව කටයුතු කර නොතිබුණි. | තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා ඇත. | ගිවිසුම් අනුව කටයුතු කර හිඟ කුලී අයකර ගතයුතු වේ. |
| (ඇ) | සභාවට අයත් කඩ කාමර 54 ක් සඳහා 2021 නොවැම්බර් 30 දිනට හිඟ කඩකුලී හා ප්‍රමාද ගාස්තු ලෙස රු.2,072,601 ක් අයවිය යුතුව තිබුණි. | අයකරමින් පවතී. | ගිවිසුම් අනුව කටයුතු කර හිඟ කුලී අයකර ගතයුතු වේ. |
| (ඈ) | 2021 වර්ෂය සඳහා සී.පී නගරයේ ඇති අංක 01 කඩ කාමරයෙන් ලැබිය යුතු හිඟ කඩ කාමර ගාස්තු රු.385,000 ක් ද අංක 02 කඩ කාමරයක් ලැබිය යුතු රු.256,500 ක්ද 2021 දෙසැම්බර් 31 දිනට අයවී නොතිබුණු අතර සභාපතිවරයා විසින් ඔහුගේ පෞද්ගලික අභිමතය පරිදි එම කඩ කාමර වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු ආදායම් රු.520,500 ක්ද කපාහැර තිබුණි. | හිටපු සභාපතිගේ උපදෙස් පරිදි මෙම කඩකුලී අය නොකළ අතර නැවත එම පුද්ගලයන්ට කඩකාමර ලබාදෙන ලදී. | විෂයභාර අමාත්‍යවරයා වෙනුවට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලබාගෙන පමණක් කපාහැරීමට කටයුතු කළයුතුය. |
| (ඉ) | පුරනැඟුම ව්‍යාපෘතියට අදාළව රාජ්‍ය බැංකු ජංගම ගිණුමක වසර 03 කට අධික කාලයක සිට රු.6,803,877 ක් පවතින අතර එම මුදල් ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර ආදායම් ලබාගැනීම සඳහා සභාව අවධානය යොමුකර නොතිබුණි. | ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කිරීමට කටයුතු කරමි. | ස්ථාවර තැන්පත් ගිණුමක ආයෝජනය කිරීමට කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු. 4,394,172 ක් වසර 07 ක් ඉක්මවූ කාලයක සිටද. ගෙවිය යුතු රු.1,678,511 ක් වූ ගිණුම් ශේෂ 03 ක් වසර 02 ත් 11 ත් අතර කාලයක සිටද මූල්‍ය ප්‍රකාශනවල පැවත එමින් තිබුණු නමුත් එම ශේෂ සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි | නිරවුල් කිරීමට කටයුතු කරමි. | අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු වාහන 04 ක් වසර 10 ක කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | 147 – 7730 යතුරු පැදිය සහ ට්‍රැක්ටර බවුසරය 2021 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන් අපහරණය කිරීමට කටයුතු කරමි. ඇග්‍රොටෙක් අත් ට්‍රැක්ටර ක්‍රියාකාරී තත්ත්වයේ පවතී. 49 1459 ට්‍රැක්ටරය මේ වන විට අළුත්වැඩියා කරමින් පවතී. | ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියාකළ යුතුවේ. |
| (ආ) | 2017 වර්ෂයේදී රු.706,140 ක් වැයකර ප්‍රාදේශීය සභාවේ ඉහළ මහලේ පිහිටි සභා ශාලාවේ සවිකර තිබූ වායු සමීකරණ යන්ත්‍ර 06 ක්, තෙකලා විදුලි පද්ධතියට සවිකිරීම සඳහා වන විදුලි රැහන් සවිකිරීම් පද්ධතිය ප්‍රමිතියට ඉදිකර නොතිබීම නිසා වසර 03 ක කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | විදුලි රැහැන් පද්ධතිය නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | වායු සමීකරණ යන්ත්‍ර භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකළ යුතු වේ. |
| (ඇ) | 2017 වර්ෂයේදී රු.227,139 ක වියදමින් ප්‍රාදේශීය සභා ඉහළ මහලේ පිහිටි සභා ශාලාවේ ඉදිකළ වැසිකිලි පද්ධතිය (Bathroom) සඳහා ජල සම්පාදන ක්‍රමයක් ඉදිකර නොතිබීම හා ඒ සම්බන්ධ අනෙකුත් කටයුතු සිදුකර නොතිබීම නිසා වසර 03 ක කාලයක සිට පාවිච්චියටගත නොහැකිව පැවතුණි. | වැසිකිලි පද්ධතියේ ජල සැපයුම නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. | වැසිකිලි පද්ධතිය භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදුකළ යුතුවේ. |